# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2390/19 - 2024 ජූනි මස 28 වැනි සිකුරාදා - 2024.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ජූනි මස 28 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2024 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. පසුව සංශෝධනය කරන ලද, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024 මැයි 13 දිනැති අංක 24/0939/604/104 දරන සංදේශය පිළිබඳ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ සහ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමග එක්ව කියවනු ලබන එකී සංදේශය සඳහා ලද 2024 ජූනි 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පහත සඳහන් රෙගුලාසි අංක 3.1 සහ 3.2 නිකුත් කරනු ලැබේ;

   3.1 ඉහතින් සඳහන් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල **I** වන උපලේඛනයේ විස්තර කරන ලද පහත විස්තර කර ඇති භාණ්ඩ හා ඒවාට අනුරූප සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | *I තීරුව* *ශීර්ෂ අංකය* | *II තීරුව* *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව* *විස්තරය* | *IV තීරුව* *ආනයන පාලන බලපත්‍ර* ***(ICL)*** |
|---|---|---|---|---|---|
| **18,241** | **07.13** | | | **පිට කුරුට්ට ඉවත්කළ හෝ නොකළ, පියළි කළ හෝ නොකළ හෝ පොතු ගැලවූ වියළි රනිල එළවළු** | |
| | | | --- | මුං ඇට : | |
| | | 0713.31.19 | ---- | අනෙකුත් | L |
| | | | --- | උඳු: | |
| | | 0713.31.22 | ---- | පිට කුරුට්ට ඉවත්කළ, පියළි කළ හෝ පියළි නොකළ | L |
| | | 0713.31.29 | ---- | අනෙකුත් | L |
| | | 0713.35 | -- | කව්පි (වින්ගා අන්ගුයිකුලාටා): | |
| | | 0713.35.90 | --- | අනෙකුත් | L |
| | | | | | |
| **244** | **10.08** | | | **බක් තිරිඟු, තණ හාල් (මිලට්) සහ කැනරි බීජ; අනෙකුත් ධාන්‍ය වර්ග.** | |
| | | | - | තණහාල් (මිලට්): | |
| | | 1008.29 | -- | අනෙකුත්: | |
| | | 1008.29.10 | --- | කුරක්කන් (ඉලියුසිනෙ කොරකානා විශේෂය) | L |
| | | | | | |
| **248** | **12.02** | | | **පොතු හරින ලද හෝ නොහරින ලද, කැබලි කළ හෝ නොකළ, නොබැදි හෝ වෙනත් ලෙසකින් පිසින ලද, රට කජු.** | |
| | | 1202.30 | - | බීජ | L |
| | | | - | අනෙකුත්: | |
| | | 1202.41 | -- | පොත්ත සහිත | L |
| | | 1202.42 | -- | පොතුහරින ලද, කැබලි කළ හෝ නොකළ හෝ | L |
| | | | | | |
| **250** | **12.08** | | | **අබ හැර තෙල් සහිත බීජ හෝ තෙලමය ඵලවල පිටි සහ ඇඹරුම්.** | |
| | | 1208.10 | - | සෝයා බෝංචිවල | L |

3.2 රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින්, ඉහත සඳහන් රෙගුලාසි අංක 3.1හි සඳහන් කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0713.31.19, 0713.31.22, 0713.31.29, 0713.35.90, 1008.29.10, 1202.30, 1202.41, 1202.42 සහ 1208.10 යටතේ වර්ග කර ඇති භාණ්ඩ තොග, එකී සෑම භාණ්ඩ තොගයකම නෞභාර පත්‍රයේ හෝ ගුවන්භාර පත්‍රයේ දිනයට පෙර නිකුත් කරන ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික ශාක නිරෝධායන සේවයේ ජාතික ශාක නිරෝධායන බලපත්‍රය ඉදිරිපත් කිරීමට යටත්ව, නිශ්කාෂණය කළ යුතුය.

4. ඉහතින් සඳහන් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල **I** වන උපලේඛනයට පහත විස්තර කර ඇති භාණ්ඩ හා ඒවාට අනුරූප සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ;

| | *I තීරුව ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ආනයන පාලන බලපත්‍ර (ICL)* |
|---|---|---|---|---|---|
| **251** | **88.06** | | | මිනිසුන් රහිත ගුවන්යානා | |
| | | 8806.10 | - | මගීන් රැගෙනයාම සඳහා සැළසුම් කරන ලද | **L** |
| | | | - | අනෙකුත්, හුදෙක්ම දුරස්ථව පාලනය කරන ගුවන් ගමන් සඳහා වන : | |
| | | 8806.21 | -- | ග්‍රෑම් 250 ට වැඩි නොවන යානයේ රැගෙන යා හැකි උපරිම බරක් සහිත | **L** |
| | | 8806.22 | -- | ග්‍රෑම් 250ට වැඩි වන නමුත් කි.ග්‍රෑ. 7 වැඩි නොවන යානයේ රැගෙන යා හැකි උපරිම බරක් සහිත | **L** |
| | | 8806.23 | -- | කි.ග්‍රෑ. 7 ට වැඩිවන නමුත් කි.ග්‍රෑ. 25 වැඩි නොවන යානයේ රැගෙන යා හැකි උපරිම බරක් සහිත | **L** |
| | | 8806.24 | -- | කි.ග්‍රෑ 25 ට වැඩි වන නමුත් කි.ග්‍රෑ. 150 වැඩි නොවන යානයේ රැගෙන යා හැකි උපරිම බරක් සහිත. | **L** |
| | | 8806.29 | -- | අනෙකුත් | **L** |
| | | | - | අනෙකුත්: | |
| | | 8806.91 | -- | ග්‍රෑම් 250 ට වැඩි නොවන යානයේ රැගෙන යා හැකි උපරිම බරක් සහිත. | **L** |
| | | 8806.92 | -- | ග්‍රෑම් 250 ට වැඩි වන නමුත් කි.ග්‍රෑ. 7 වැඩි නොවන යානයේ රැගෙන යා හැකි උපරිම බරක් සහිත | **L** |
| | | 8806.93 | -- | කි.ග්‍රෑ. 7 ට වැඩි වන නමුත් කි.ග්‍රෑ. 25 ට වැඩි නොවන යානයේ රැගෙන යා හැකි උපරිම බරක් සහිත | **L** |
| | | 8806.94 | -- | කි.ග්‍රෑ. 25ට වැඩි වන නමුත් කි.ග්‍රෑ. 150 වැඩි නොවන යානයේ රැගෙන යා හැකි උපරිම බරක් සහිත | **L** |
| | | 8806.99 | -- | අනෙකුත් | **L** |

5. සංශෝධිත, විශේෂ ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු පළකරන ලද 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* I වන උපලේඛනයට, පහත සඳහන් අයිතම සඳහා ගෙවිය යුතු ආනයන පාලන බලපත්‍ර ගාස්තු මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| *අනු අංකය* | *භාණ්ඩය* | *ආනයන පාලන බලපත්‍ර ගාස්තුව* |
|---|---|---|
| 96 | මිනිසුන් රහිත අහස්යානා | මි.ර.ගැ වටිනාකමින් 0.5 % |

6. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

7. ඉහත රෙගුලාසිවලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබා දෙනු ලැබේ.

EOG 07-0086

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.